# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

## විශෙෂ අතිරෙඛය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

**නො. 8,113 — 1935ක්වූ මාර්තු මස 30 වෙනි දිනවූ සෙනසුරාදා.**


# Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

### අන්‍ය දැන්වීම්.

මඩකලපු දිස්ත්‍රික්කයේ කල්ලඩියේ පදිංචි කනපතිපිල්ලේ නල්ලතම්බි සෙල්වදුරේ වන මම වර්ෂ 1907ගේ නො. 1 දරණ ආඥාපනතේ 6වෙනි වගන්තිය යටතේ මඩකලපු දිස්ත්‍රික්කයේ කරුන්කොඩ්ඩතීවුවේ නොතාරිස් කෙනෙක් හැටියට වැඩ කිරීමට අනුලත්වීම පිණිස මෙවක් පටන් තුන්මාසයක් ඉකුත්වූවිට රිජිස්ත්‍රාර් ජනරාල් උන්නාන්සේගෙන් ඉල්ලුම්කරන්ට අදහස්කර සිටින බව ඉහතකී ආඥාපනතේ 1 B දරන උප ලේඛනයේ නො. 11 දරන නියෝගය අනුව මෙසින් දැනුම්දෙමි.

වර්ෂ 1935ක්වූ මාර්තු මස 18වෙනි දින
කල්ලඩියේදීය.

K. N. SELVADURAI.

---

කෑගල්ලේ පදිංචි කපුගම ගීගණගේ ඩාර්ලිස් ද සිල්වා යන මම සබරගමු පලාතේ කෑගලු දිස්ත්‍රික්කයේ පහත බුලත්ගම කෝරළයේ කිතුල්ගල සිංහල භාෂාවෙන් වැඩකරණ නොතාරිස් කෙනෙකු හැටියට පත්වීමට මෙතැන්පටන් තුන්මාසයක් ගියතැනදී රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලාසිටීමට අදහස්කර සිටින බව වර්ෂ 1907ගේ අංක 1 දරණ ආඥාපනතේ 1වෙනි ඇමුල් පත්‍රයේ "බී" සටහනේ 1, 2 යන අධිකවල ප්‍රකාර මෙසින් දැනුම්දෙමි.

කෑගල්ල,
14. 3. 35

කේ. ජී. ඩාර්ලිස් ද සිල්වා.

---

මෙහි පහත නම සඳහන් රත්නපුරේ පදිංචි ගසබඩවිදානෙලාගේ හෙවත් බලන්ගොඩමුහන්දිරමලාගේ ජයවර්ධන යන මම වර්ෂ 1907ගේ අංක 1 දරණ ආඥාපනතේ 6වෙනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන් පත්කරන පිණිස මෙදින සිට තුන්මාසයක් ගතවූ වහාම රෙජිස්ට්‍රාර් ජනරාල් උන්නාන්සේගෙන් ඉල්ලීමට අදහස්කර තිබෙන බව එකී ආඥාපනතේ 1 B දරණ උප ලේඛනයේ දෙවෙනි නියෝගයේ ප්‍රකාර මෙසින් ප්‍රකාශකර සිටිමි.

18. 3. 35,
රත්නපුර

ජී. වී. ජයවර්ධන.

---


PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.

147——J. N. 46949—133 (3/35)